## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින ප්‍රසම්පාදන නිළධාරී සහ නඩත්තු නිළධාරී තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් කාර්යශීලි, උද්යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රසම්පාදන නිළධාරී II ශ්‍රේණිය (JM 1-1)

**රැකියා පිරිවිතරය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිළධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් :**

(අ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය පරිපාලන / විද්‍යාව / වාණිජ්‍යය / ආර්ථික විද්‍යාව යන විෂයන්ට මුල්තැන ලබාදෙමින් ලබාගත් ප්‍රථම උපාධිය.

සහ

එම උපාධි සුදුසුකම ලැබීමෙන් අනතුරුව රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සේවයේ කළමනාකරණ සහකාර I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති අ.පො.ස.(උ/පෙළ) විභාගයේ අවම විෂයන් 03 ක් එකවර සමත් වී ඇති නිළධාරීන්.

පරිඝණක සාක්ෂරතාවය හා ඉංග්‍රීසි දැනුම අත්‍යවශ්‍ය වේ.

## නඩත්තු නිළධාරී II ශ්‍රේණිය (JM 1-1)

**රැකියා පිරිවිතරය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ගොඩනැගිලි හා වාහන සම්බන්ධ සියළුම නඩත්තු කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් :**

(අ) යාන්ත්‍රික ඉංජිනේරු විෂය හෝ සිවිල් ඉංජිනේරු විෂය සම්බන්ධ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය සහ උපාධිය ලබාගැනීමෙන් අනතුරුව රජයේ හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු විෂය හෝ සිවිල් ඉංජිනේරු විෂය සම්බන්ධව ලබාගත් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) සහ ඩිප්ලෝමා සුදුසුකම ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 06 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ I ශ්‍රේණියේ තාක්ෂණ සහකාර (නඩත්තු) තනතුරෙහි වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරියෙකු වීම සහ යාන්ත්‍රික ඉංජිනේරු හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි හඳු 05 මට්ටමට නොඅඩු සහතිකයක් ලබා තිබීම.

**කණිෂ්ඨ කළමනාකරණ තනතුරු සඳහා වැටුප් පරිමාණය, වයස් සීමාව, හා තෝරා ගැනීම.**

**වැටුප් පරිමාණය :**

JM 1-1 2016 (රු.42,600 - 10 x රු.755/- 18 x රු.1135 ) රු. 70,580) (මාසිකව)
රජයේ අනුමත අනෙකුත් දීමනාද සහිත ආරම්භක මාසික දළ වැටුප රු.45,000/-

**වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**තෝරා ගැනීම** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කොන්දේසි :**

- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාල වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 04 ඡේදය ප්‍රකාරව පිහිටුවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ -**

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීති වලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

**අයදුම් කිරීම -**

රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ www.srilankateaboard.com වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ **2023 ජූලි 12** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**
**574, ගාලුපාර,කොළඹ 3.**